# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/26 - 2019 අගෝස්තු මස 28 වැනි බදාදා - 2019.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය:* KDS/PDB/4/3/2/4.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/9/2015/WS/127.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලේගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, අළුත්ගම මහකුඹුරේ ගම්මැද්ද ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට මහනුවර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක මහ/6918 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0078ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්:

**කැබලි අංක 1 - ඉඩමේ නම: - ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0074**

උතුරට: මුපි A 1742 හි 127 වැනි බිම් කැබැල්ල, මුපිමහ 6917 හි 1 සහ 2 වැනි බිම් කැබලි; නැගෙනහිරට: 2 වැනි බිම් කැබැල්ල; දකුණට: මුපි A 1742හි 127 වැනි බිම් කැබැල්ල; බටහිරට : මාර්ගය.

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් : රජය

**කැබලි අංක 2 - ඉඩමේ නම: - ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0004**

උතුරට: මුපි මහ 6917 හි 1 සහ 2 වැනි බිම් කැබලි; නැගෙනහිරට: මුපි A 1742හි 107 වැනි බිම් කැබැල්ල; දකුණට: මුපි A 1742හි 107 සහ 127 වැනි බිම් කැබලි; බටහිරට: 1 වැනි බිම් කැබැල්ල.

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන් : රජය

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 ඔක්තෝබර් මස 23 වැනි දින පෙ. ව. 10.00ට පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 ඔක්තෝබර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඩී. ජී. සී. ජයතුංග,
ප්‍රාදේශීය ලේකම්,
පාතදුම්බර.

2019 අගෝස්තු මස 23 වැනි දින,
පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 379

1A - G 30843 – 17 (2019/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*